සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

06 ශ්‍රේණිය

# පුරවැසි අධ්‍යාපනය

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 01- 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.

01. පාසලේ ඉතිහාසය දැන ගැනීමට ලොග් පොත මෙන්ම ........................................................ ගෙන් ද ලබාගන්නා තොරතුරු ද වැදගත් ය. (ශිෂ්‍යාවන් / දෙමාපියන් / විශ්‍රාමික විදුහල්පතිවරුන්)

02. පාසලක සංවිධාන ව්‍යුහය ගත්විට ආදි ශිෂ්‍ය සංගමය හා ........................................................ කමිටුවට ද වැදගත් තැනක් හිමිවේ. (පරිසර / පාසල් සංවර්ධන / සුබසාධක)

03. ඔබේ යුතුකමක් ලෙස පාසලේ පවතින ........................................................ තුළින් පාසලේ ගුණාත්මක බව වැඩි කර ගත යුතුය. (සම්පත් ආරක්ෂා කිරීම / පිරිසිදු බව / ක්‍රමවත් බව)

04. ආවේගශීලී බව හා ........................................................ ඔබේ අභියෝග ජය ගැනිමට බාධාවක් වේ. (නිර්මාණශීලී බව / අලස බව / විද්‍යුත් මාධ්‍ය භාවිතය)

05. ඔබේ දක්ෂතා ........................................................ පෙන්වීම මගින් ඔබේ දියුණුව සලසා ගත හැකිය. (නිරන්තරයෙන් / අවශ්‍ය වූ විට / අවස්ථානුකූලව)

- අංක 06 - 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06 දුර්වලතා අන් අය පෙන්වා දුන්විට ඒවා නිහතමානීව පිළිගැනීම සැම දෙනෙකුම සතු හොඳ ලක්ෂණයකි. ( )

07 සෑම අභියෝගයක්ම ජීවිත සාර්ථකත්වයට තුඩුදෙන ශක්තියකි. ( )

08 පාසල තම දක්ෂතා ප්‍රදර්ශනයට අවස්ථා ලබාදෙන අතරම තනිව ක්‍රියාකිරීමට පුහුණු කරයි. ( )

09 යහපත් අරමුණු ඇතිකර ගැනීම සිසුන්ට මෙන්ම සමාජයේ ද ප්‍රගතියට හේතු වේ. ( )

10 පාසලේ සියලු දෙනාගේම අයිතිවාසිකම් මැනවින් ආරක්ෂා කිරීම සඳහා පාසලට සෑම දිනකම පැමිණිය යුතුය. ( )



LIVEWORKSHEETS

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 පාසල් ගීතය මගින් ඉටුවන සුවිශේෂී මෙහෙය වන්නේ මින් කුමක් ද?

(1) පාසලට අභිමානයක් ඇතිවීම.

(2) පාසලෙන් ජාතියට සිදුවන මෙහෙය පිළිබඳ සිතුවිලි ජනිත වීම.

(3) වෙනත් කිසිඳු කාර්යයකට අවධානය යොමු නොකිරීම.

(4) සිරුවෙන් සිටීමට හුරු පුරුදු වීම.

12. පාසල අනාගතයේ දී ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණ දක්වෙන්නේ මින් කුමකින් ද?

(1) මෙහෙවර (2) පාසල් ගීය (3) දැක්ම (4) පාසල් කොඩිය

13. පාසලේ සාමාජිකයෙකු ලෙස ඔබ ඉටුකළයුතු යුතුකමක් මේවායින් තෝරන්න.

(1) ආරක්ෂා සහිතව සිටීම.

(2) අධ්‍යාපනය ලැබීම.

(3) අදහස් ප්‍රකාශ කිරීම.

(4) සිසුන් සමග සමානාත්මතාවයෙන් යුතුව කටයුතු කිරීම.

14. මේවායින් සමාජයෙන් පාසලට සැපයෙන සේවාවක් වන්නේ කුමක් ද?

(1) මනා සෞඛ්‍යාරක්ෂිත ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම.

(2) විනය ගරුක පුද්ගලයින් බිහි කිරීම.

(3) දක්ෂතා එළිදක්වීමට අවස්ථා ලබාදීම.

(4) අනාගත නායකයන් පුහුණු කිරීම.

15. මොණරාගල, අම්පාර, පොළොන්නරුව යන දිස්ත්‍රික්ක අයත් වන පළාත් පිළිවෙලින් අඩංගු වන පිළිතුර තෝරන්න.

(1) වයඹ, මධ්‍යම, නැගෙනහිර (2) ඌව, නැගෙනහිර, උතුරුමැද

(3) සබරගමුව, දකුණ, නැගෙනහිර (4) උතුරුමැද, ඌව, මධ්‍යම

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියා දක්වන්න.**

16 ශ්‍රී ලංකාව පරිපාලන දිස්ත්‍රික්ක ...................................................................... කින් සමන්විත ය.

17 බලශක්තිය නිපදවීම සඳහා සුළඟ, හිරුඑළිය මෙන්ම ...................................................... ද උපයෝගී කර ගනී.

18 යහපත් පරිසරයක් පවත්වාගෙන යාම සඳහා භෞතික සම්පත් කාර්යක්ෂම හා .............................................. යුතුව භාවිතා කළ යුතුය.

19 මිනිසාගේ .................................................. සහ කායික හැකියා වැඩි දියුණු කර ගැනීමෙන් මානව සම්පත් බිහිවෙයි.

20 මිනිසාගේ සාමූහික පැවැත්ම දියුණු ................................................................... ගොඩ නැගීමට හේතු වී තිබේ.

(ලකුණු 2 x 20 = 40)



LIVEWORKSHEETS